මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය කාර්යාලය
பொது பாதுகாப்பு மற்றும் பாராளுமன்ற விவகாரங்கள் அமைச்சரின் அலுவலகம்
Office of the Miniter of Public Security and Parliamentary Affairs
18 වන මහල, 'සුහුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. 18 மாடி சுஹுருபாய பத்தரமுல்ல இலங்கை 18th Floor, 'Suhurupaya', Battaramulla, Sri Lanka.

මගේ අංකය / எனது இல. / My No. } PS/MED/01 /2025

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2025.04.18

ප්‍රියන්ත වීරසූරිය මහතා,

වැ.බ. පොලිස්පති,

පොලිස් මූලස්ථානය,

කොළඹ 02.

මහත්මයාණෙනි,

**මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය ආනන්ද විජේපාල මහතා සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය තුළ සංසරණය වන ව්‍යාජ ප්‍රවෘත්තිය සම්බන්ධයෙනි.**

මහජන ආරක්ෂක හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය ආනන්ද විජේපාල මහතා සහ නිශ්ශංක සේනාධිපති නැමැත්තා සම්බන්ධ කරමින් ව්‍යාජ ලෙස සකස් කරන ලද ප්‍රවෘත්තින් සමාජ මාධ්‍ය තුළ සංසරණය වනු නිරීක්ෂණය විය. අමාත්‍ය ආනන්ද විජේපාල මහතා විසින් තම අමාත්‍යංශයේදී නිශ්ශංක සේනාධිපති නැමැත්තා මුණ ගැසුණු බව හැඟෙවන ආකාරයෙන් එකී ප්‍රවෘත්තින් නිර්මාණය කර ඇත.

එහෙත් එකී ප්‍රවෘත්තින් ව්‍යාජ ප්‍රවෘත්තින් වන අතර කිසිදු අවස්ථාවක ආනන්ද විජේපාල මහතා හෝ ඔහුගේ නියෝජිතයෙකු නිශ්ශංක සේනාධිපති නැමැත්තා මුණ ගැසී නොමැත. එහෙත් මෙලෙස දිගින් දිගටම ව්‍යාජ ප්‍රවෘත්තින් නිර්මාණය කිරීම හරහා අමාත්‍ය ආනන්ද විජේපාල මහතාගේත් වත්මන් රජයේත් කීර්ති නාමය හා ජනතා විශ්වාසය පළුදු වීමක් සිදු වන බව නිරීක්ෂණය වේ. එමෙන්ම දිගින් දිගටම සාවද්‍ය ප්‍රවෘත්තින් සමාජගත වීම හරහා සත්‍ය තොරතුරු දැන ගැනීම සඳහා මහජනතාව සතු අයිතිය උල්ලංඝනය වීමක් සිදු වන අතර චේතනාන්විත ලෙස සාවද්‍ය තොරතුරු සමාජගත කිරීම හරහා සමාජයට අගතිදායී ප්‍රතිඵල ඇති කරන්නක්ය යන්න අපගේ හැඟීමයි.

ඒ අනුව එලෙස පළ කරන ලද ව්‍යාජ ප්‍රවෘත්තින්වල පිටපත් කිහිපයක් මේ සමඟ අමුණා ඉදිරිපත් කරන අතර මෙකී ව්‍යාජ ප්‍රවෘත්තින් පිළිබඳව නිසි පරිදි පරීක්ෂණ පවත්වා අවශ්‍ය නෛතික පියවර ගැනීමට කටයුතු කරන ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිමු.

මාධ්‍ය ලේකම්

එම්.ඒ.බී. දිකාශු
මාධ්‍ය ලේකම්
මහජන ආරක්ෂක සහ
පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය
18 වන මහල 'සුහුරුපාය' බත්තරමුල්ල

පිටපත්


01. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, අපරාධ පරීක්ෂණ හා මූල්‍ය අපරාධ විමර්ශන

02 නියෝජ්‍ය පොලිස්පති, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව.

03 අධ්‍යක්ෂ, පරිගණක අපරාධ විමර්ශන ඒකකය.

Office :- 0112 288 7485 / 0112 288 7307 / 0112 288 7268

CS CamScanner


13:13
57%
Cyber News LK
Message Us
BER NEWS LK
Cyber News LK
17K likes · 21K followers
The Investigation of Truth....
Learn more
Like
Posts
About
Photos
Videos
Reels
Details
Page · News & media website
Pinned post
Cyber News LK
Jul 31, 2022

**Cyber News LK**

පසුගියදා ලංකාවේ විපක්ෂයේ ප්‍රබල දේශපාලඥයෙක් නීතිය හා සාමය අමාත්‍යංශයට ගියේ එහි ප්‍රධානියකු හමුවී රහස් තොරතුරක් පැවසීමටය. ඔහු එහි යන විට එම අමාත්‍යංශ ප්‍රධානියාගේ මේසය ඉදිරිපිට වාඩිවී සිටි පුද්ගලයා දුටු ප්‍රබල දේශපාලඥයාට ඇති වූයේ ඉහින් කනින් දදිය දමන තරමේ කම්පනයකි. තමන් අනාවරණය කිරීමට ගිය රහසිගත තොරතුර පැවසීම කෙසේ වෙතත් අමාත්‍යංශ ප්‍රධානියා හමුවීමට යාම පවා තමා විසින් කළ මෝඩ කමක් බව දේශපාලඥයාට සිතුණි. නීතිය හා සාමය අමාත්‍යංශයේ ඒ ප්‍රධානියා අසල ඉදිරිපස අසුනේ සිටියේ වෙනින් කවුරුත් නොවේ. ඇවන්ගාඩ් ආයතනයේ මේජර් සේනාධිපතිය. එහි ගිය ප්‍රබල දේශපාලඥයාද මේජර් සේනාධිපති හොඳින් දන්නා අඳුනන අයෙකි. මීට අවුරුදු ගණනකට පෙර ජනතා විමුක්ති පෙරමුණ හා සේනාධිපති අතර පැවති තයි මුගටි ආරවුල ගැන විපක්ෂයේ ප්‍රබල දේශපාලඥයාට සිහිපත් වුන අතර නීතිය හා අමාත්‍යංශයේ ප්‍රධානියා සමග ගජේ දමා ගෙන සිටීමට තරමේ යාළු කමක් සේනාධිපති හා එම ප්‍රධානියා අතර තිබේ යැයි ඔහු සිහිනෙකින් වත් විශ්වාස නොකෙරුවේය. මෙහිදී සිදුවුන සිද්ධිය එම විපක්ෂ දේශපාලඥයා අපට පැවසුවේ මේසේය "......මම නීතිය හා අමාත්‍යංශයෙට ගියෙ අහවලා හම්බ වෙන්න. මම එයාගෙ ඔෆිස් කාමරයට යද්දි එතැන හිටියෙ මේජර්

Write a comment...

ඔෆිස් කාමරයට යද්දි එතැන හිටියෙ මේජර් සේනාධිපති. මං එතැනට යද්දිත් සේනාධිපති එහි සිටියෙ මාත් ඔහුත් දන්න කියන නිසා වෙන්නැති. ඒක නොවෙයි වැඩේ. මං එතැනට ගිහිල්ල වාඩි වුනාම සේනාධිපති තමා ඒ අර අහවලාගෙ පියන්ට කතා කරල මට තේ එකක් ගෙන්න කියල කිව්වෙ. මට ඒ සිද්ධියෙන් තේරුනා සේනාධිපති මේ කාර්යාලය තුළ පවා බලය පතුරගෙන සිටින බව. "මම දේශපාලඥයෙක් විදියට දන්නවා සේනාධිපති හා ජවිපෙ අතර පැවතුන ආරවුල ගැන. සේනාධිපති එක් වරක් ජවිපෙට අභියෝග කරල කිව්වෙ මගේ වත්කමේ අන්තිම සතයත් වියදම් කරල ජවිපෙ නැත්තට නැති කරනවා කියල. දැන් මේ රටේ ඉන්නෙ ජවිපෙ නියෝජනය කළ ජනාධිපතිවරයෙක්. මට පුදුම ඒකයි. එතැනදි මට තේරුම් ගන්න තියෙන්නෙ සේනාධිපතියි ජනාධිපතියි දැන් යාළුවෝ කියල විතරයි. එහෙම යාළු කමක් නැතිනම් නීතිය හා සාමය අමාත්‍යංශෙ ප්‍රධානියා තමන්ගෙ කාර්යාලයට සේනාධිපති ගෙන්න ගෙන චැට් කර කර ඉන්න බැහැ. සේනාධිපති කියන්නෙ ලුම්පන් ව්‍යාපාරික බූවල්ලෙක්. ඔහු ආණ්ඩුවෙ ප්‍රධානීන් වගේම පොලීසියෙ ලොක්කො හසුරවන්නෙ මුදල් විසි කරල. ඔහු රාජපක්ෂ පවුලේ පැවැත්ම සදහා ඕනෑම තක්කඩි කමක් කරාවි. විශේෂයෙන් ගෝඨාභයත් ඔහුත් අතරත් පවතින්නෙ දැඩි සමීප සම්බන්ධතාවක්. පසුගියද අපේ මුජිබර් රහුමාන් මන්ත්‍රීවරයා පාර්ලිමේන්තුවේදී ප්‍රකාශ කෙරුවා පොලීසියේ සේවය කළ අන්ත දූෂිතයෙක් නීතිය හා සාමය අමාත්‍යංශයෙ

Write a comment... GIF

උපදේශකයෙක් වෙලා ඉන්නව කියල. ආණ්ඩුව ඒ සම්බන්ධයෙන් කටේ කෙළ බිංදුවක් හෙළුවෙ නෑ. කාරණේ ඇත්තනේ. නීතිය හා සාමය ඇමති ආනන්ද විජේපාලගෙ මිත්‍රයා තමා ඒ. එතකොට ආණ්ඩුවෙ ප්‍රතිපත්තිය මේ රටේ රාජ්‍ය ආයතන වලින් දූෂණය පිටු දැකීම. ඒත් නීතිය හා සාමය ඇමති උපදෙස් ගන්නෙ පට්ට දූෂිතයෙක් ගෙන්. ඒ අස්සෙ තමා අමාත්‍යංශ ප්‍රධානියා සේනාධිපති එක්ක හුරතල් වෙන්නෙ. මේ ගණුදෙනු අනුර කුමාර දිසානායක ජනපතිවරයා නොදන්නවා වෙන්න බැහැ. එහෙම නොදැන ඉන්නව නම් මේ රටේ බුද්ධි සේවාවන් වලින් ලබා දෙන තොරතුරු ජනාධිපතිවරයාට දෙන්නෑ කියල තමයි හිතන්න වෙන්නෙ. මේ රටේ නීතිය හා සාමය ආරක්ෂා කරන්න වගකීම පැවරිල තියෙන අමාත්‍යංශයෙ උපදේශකය පට්ට දූෂිතයෙක් වෙද්දි එහි පරිපාලනමය ප්‍රධානිය සේනාධිපති එක්ක ගනුදෙනු කරනවා කියද්දි ජාජබයට ඡන්දෙ දීපු ජනතාව ගැන අපට ඇතිවෙන්නෙ බරපතල කණගාටුවක්. ඇත්තටම දුකක් දැනෙනවා. ජාජබයට විරුද්ධ දේශපාලඥයෙක් විදියට මේ ආණ්ඩුව ගැන මම බොහොම විශ්වාස කෙරුවා. ඒත් දැන් බලා ගෙන යද්දි මෙයාල අමු තක්කඩි කියල හිතෙනවා. ජනාධිපති අනුර කුමාර දිසානායක තමන්ගෙ මිත්‍රය ආනන්ද විජේපාලගෙ හිත රිදවන්න බැරි නම් වෙන විකල්පයකට ගිහිල්ල ඔහුගෙන් නීතිය හා සාමය අමාත්‍යංශ ගලවල ඔහුට වෙන අමාත්‍යංශයක් බාර දෙන්න ඕන. ආනන්ද විජේපාල පොලීසියෙ හිටිය එස්අයි කෙනෙක් කියනවනේ .හැබැයි එයා ඇමති වෙලත්

Write a comment...

කරන්නෙ පොලීසියෙ එස්අයි කෙනෙක් කරන වැඩ. ඒකටත් පොලීසියෙ පාවා දෙන තරමට දූෂිතව රාජකාරි කරපු පැන්ෂන් කාරයෙක් උපදේශකය කරගෙන තියෙන්නෙ. ඒ උපදේශකයට එරෙහිව තාජුඩීන් ඝාතනයේ සාක්ෂි වසන් කරාය කියන චෝදනාවම ඇති නීතිය හා සාමය අමාත්‍යංශයෙ පැත්ත පලාතෙ ගෙන්න නොගන්න. ඒක එහෙම තියෙද්දි අමාත්‍යංශෙ පරිපාලන ප්‍රධානියා ගනුදෙනු කරන්නෙ මේජර් සේනාධිපති එක්ක. එයා පාස්කු ප්‍රහාරයට සම්බන්ධ බවට චෝදනාවක් එල්ල වෙනවා. ඒත් දැන් ඔහු නීතිය හා සාමය අමාත්‍යංශෙ පරිපාලන ප්‍රධානියා හමුවන්න එන අමුත්තන්ට තේ සපයන්නා බවට පත් වෙලා. විපක්ෂෙ මන්ත්‍රීවරයෙක් විදියට මට සතුටු වෙන්න පුළුවන් මේ ජරා වැඩ දැකල. ඒත් මගේ හෘද සාක්ෂිය තියෙන්නෙ බරපතල අවුලක. මං විපක්ෂයෙ හිටියට මේ මිනිස්සු මේ රට ගොඩ දුවි කියන විශ්වාසය මට තිබ්බා. අන්න ඒ නිසා මම ඇහැට දැකපු මේ සිද්ධියෙන් දැඩි කම්පනයට පත් වෙනවා. අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයා ස්ටේජ් වල දීල අත අරින මිසයිල් ඔක්කොම පුස් වෙඩි කියල විතරක් වැටහෙන්නෙ නීතිය හා සාමය අමාත්‍යංශෙ ඇතුළෙ මේ සිද්ධ වෙන ගජ මිතුරු හවුල් දැක්කාමයි. මට නම් කියන්න තියෙන්නෙ බොරුවෙන් හැමදාම මිනිස්සු රවටන්න බැහැනේ. නුමුත් මෙහෙම එකක් තියෙනවා. ජාජබය ගැන විශ්වාස කරපු මේ රටේ ජනතාව මෙයාල ගැන කළකිරුනොත් මහා ඛේදවාචකයකින් තමයි ජාජබ දේශපාලනය කෙළවර වෙන්නෙ. මං කිව්ව කියල ලියල

Write a comment...

Cyber News LK's post

කෙළවර වෙන්නෙ. මං කිව්ව කියල ලියල තියාගන්න. කොහොම හරි එද මම ආණ්ඩුවට දෙන්න ගිය රහසිගත තොරතුර දුන්නෑ. මොකද මේ වගේ කෙනෙකුට ඒ තොරතුර දීල කෙලවගන්න මට ඕන කමක් නෑ. එහෙම නම් මම ඒ තොරතුර සේනාධිපතිටම දුන්න වගේ වෙනවා. ඒ කියන්නෙ රාජපක්ෂලාම ඒ සම්බන්ධයෙන් දැනුවත් වෙනවා. නීතිය හා සාමය අමාත්‍යංශෙ වැඩ මෙහෙම නම් ඉතින් ආණ්ඩුව ගැන කවර කතාද. පැලවත්තෙ විල්වත් සිල්වා මහත්තය ස්ටේජ් වල කවි කවි කිය කිය ආණ්ඩුව ගොඩ දන්න බලනවනේ. හැබැයි දැන් ඒ මහත්තයට තියෙන්නෙ විරුදු බණ කැසට් එකක් ගහල කීයක් හරි හොයාගන්න. මොකද ගෝල බාල ඇමතිලයි ලේකම්ලයි මේ කෙලින පිස්සු වලට ආණ්ඩුව කොහෙන් නතර වේද දන්නැති හන්ද

**නාවික හමුදාවට අයිති විය යුතු ඩොලර් මිලියන ගණනක් සොරා කෑ මෙන්ම අරගලකරුවන්ට පොලු හමුදාවන් ලවා පහර දුන් ඇවන්ගාඩ් හොරා නීතිය සහ සාමය ඇමතිගේ රෙද්ද අස්සෙන් මතුවේ**



Write a comment...